## ඉදිකිරීම් ආයතන හා උපදේශක සේවා සපයන ආයතන ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය

## වයඹ පළාත් සභාව

01. 2021 වර්ෂය සඳහා පහත සඳහන් වැඩ විෂයන්ට වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා ආයතන වල ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා ඉදිකිරීම් ආයතන සහ උපදේශක සේවා සපයන ආයතන ලියාපදිංචි කර ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| ලියාපදිංචි සංකේත අංකය | වැඩ විෂය |
|---|---|
| NWP/CS/E/Reg./2020/01 | ව්‍යුහ නිර්මාණ සැලසුම් සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම-2021 |
| NWP/CS/E/Reg./2020/02 | විදුලි පද්ධති ස්ථාපිත කිරීම සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම - 2021 |
| NWP/CS/E/Reg./2020/03 | ජල සැපයුම්, ජලනල වැඩ හා පල්දෝරු පද්ධති සඳහා ඉංජිනේරු උපදේශක සේවා සැපයීම - 2021 |
| NWP/CS/E/Reg./2020/04 | වාස්තු විද්‍යාඥ සැලසුම් සඳහා උපදේශක සේවා සැපයීම - 2021 |
| NWP/CS/E/Reg./2020/05 | කොන්ත්‍රාත් ආයතන ලියාපදිංචි කිරීම. (ගොඩනැගිලි/මාර්ග/ වාරිමාර්ග) - 2021 |

02. <u>සුදුසුකම්</u>

**i.** වැඩ විෂය - **NWP/CS/E/Reg./2020/01, NWP/CS/E/Reg./2020/02, NWP/CS/E/Reg./2020/03**

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර උපදේශක සේවා සපයන ආයතනයක් ලෙස ලියාපදිංචි වීම හෝ රජයේ හෝ පෞද්ගලික අංශයේ උපදේශක සේවා සැපයීම පිළිබඳව පළපුරුද්දක් ඇති වරලත් ඉංජිනේරුවරයෙකු විය යුතුය.

ii. වැඩ විෂය - **NWP/CS/E/Reg./2020/04**

ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර උපදේශක සේවා සපයන ආයතනයක් ලෙස ලියාපදිංචි වීම හෝ රජයේ හෝ පෞද්ගලික අංශයේ උපදේශක සේවා සැපයීම පිළිබඳව පළපුරුද්දක් ඇති වරලත් වාස්තු විද්‍යාඥයෙකු විය යුතුය.

**iii.** වැඩ විෂය - **NWP/CS/E/Reg./2020/05**

වයඹ පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල ඉදිකිරීම් හා අළුත්වැඩියා සඳහා (ගොඩනැගිලි/මාර්ග/වාරිමාර්ග) සීමිත මිලගණන් කැඳවීම යටතේ ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අසාධුලේඛන ගතව නොසිටිය යුතු අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

03. ලියාපදිංචි කිරීමේ ලේඛන **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා), ඉංජිනේරු සේවා අංශය, තුන්වන මහල, E - ගොඩනැගිල්ල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල** යන ලිපිනයට ලියූ අයදුම් පත්‍රයකින් එක් ලියාපදිංචි ලේඛනයක් සඳහා අංක 1 සිට 4 දක්වා මුදලින් රු.2000/-ක ආපසු නොගෙවන ගාස්තුවක් හා අංක 5 සඳහා මුදලින් රු.250/-ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් **2020.12.08** දින **ප.ව.3.00** දක්වා සතියේ වැඩ කරන දින වලදී ලබා ගත හැකිය.

04.මුද්‍රා තබන ලද ලියාපදිංචි කිරීමේ ලේඛන 2020.12.09 දින පෙ.ව.10.00ට පෙර ලැබෙනසේ **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), ඉංජිනේරු සේවා අංශය, තුන්වන මහල, E - ගොඩනැගිල්ල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කල යුතුවේ. අදාල වැඩ විෂය ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සටහන් කල යුතුය.

05. අයදුම්පත් භාරගැනීම අවසන්වූ වහාම විවෘත කරන අතර අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ඒ සඳහා සහභාගී විය හැක.

06. වැඩි විස්තර **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා)** ඇමතීමෙන් ලබා ගත හැකිය.

දුරකථන අංකය - 037 2227664 ෆැක්ස් - 037-2052876 ඊ-මේල් - dcs.eng.nwp@gmail.com

ප්‍රධාන ලේකම් / සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

දිනය - 2020. 11 . 11